# විභංග අට්ඨකථාවේ මිනිස් ශරීර අස්ථි කොටස් වර්ගීකරණය හා උපමා භාවිතය

**කහටගස්දිගිලියේ ධම්මරතන හිමි**

**සාරසංග්‍රහය**

අභිධර්ම පිටකයේ සප්ත ප්‍රකරණයට ඇතුළත් විභංග ප්‍රකරණය සඳහා ලියන ලද විස්තර වර්ණනාව ''සමෙමාහවිනෝදනී'' අට්ඨකථාව නමින් හැඳින්වේ. සම්මෝහවිනෝදනී යන්නෙහි වචනාර්ථය වැටහීම්, මුලාවීම්, දුරුකිරීමය. මෙය බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද කෘතියක් යැයි පොදු පිළිගැනීමය.

මෙහි විභංග වශයෙන් (ඛන්ධාදි අටළොස් විභංගයන්) ගණන 18 කි. ධාතු විභංගය ද සූත්‍රාන්ත භාජනීය, අභිධර්ම භාජනීය වශයෙන් කොටස් දෙකකි. විභංග අට්ඨකථාවේ ස්ථාන දෙකක දී ශරීර අස්ථි කොටස් පිළිබඳ විස්තර කර ඇති බව නිරීක්ෂණය වෙයි.

01. ධාතු විභංගය - ''ධාතු සය'' විස්තර කරන තැන.

02. සතිපට්ඨාන විභංගය - කේසා, ලෝමා, නඛා, දන්තා ආදී වශයෙන් ''අට්ඨි'' අටවැනි අංගය ලෙස

මෙහි එන සියලු ධාතු ''ඡ ධාතුයෝ'' මැයෙන් හකුළුවා ගණනින් හයක් බව කියයි. එසේම එක් එක් ධාතුව ස්වභාව ශූන්‍ය අනාත්ම වශයෙන් ගත යුතු බව දක්වයි. එනම් පඨවි ධාතු ආදියෙහි ධාතු අර්ථය ස්වභාව අර්ථයයි. ස්වභාව අර්ථය නම් ''ආත්මයක් නැත'' යන අර්ථය යි. මෙහි මිනිස් ශරීරය ගැන ප්‍රමාණවත් වර්ගීකරණයක් කර ඇත. සතිපට්ඨාන විභංගය ''ආතාපි'' කය පිරික්සන වීර්යයෙන් යුතුව ''සම්පජානො'' කය පිරික්සන මනා දැනීමකින් යුතුව ''සතිමා'' කය පිරික්සන සිහියෙන් යුතුව ''කායෙ කායානුපස්සි විහරති'' කායානුපස්සනා සතිපට්ඨානය සඳහා යෝගාවචරයාට කර්මස්ථාන ලබා දීම අනුව විමසා බැලීමේ සමථ කර්මස්ථාන විස්තර කර ඇත. එහි දී

''අජ්ඣත්තං කායං'' තමාගේ කය ගැන ''උද්ධං පාදතලා'' පාදන්තයේ සිට ඉහළට ද ''කෙසමත්‍ථකා'' කේසාන්තයේ සිට පාදාන්තය දක්වා අනිත්‍ය පෙරටු කොට පිරික්සා බැලීමට ශ්‍රාවකයා මෙහෙයවා ඇත. එහි කේසා, ලෝමා, නඛා, දන්තා, මංසං, නහරු, අට්ඨි වශයෙන් 32 වූ කර්මස්ථාන (ද්වත්තිංසාකාරය) අටවැනි අංගය ලෙස ශරීරයේ අස්ථි පද්ධතිය ගැන පරිපූර්ණ විස්තරයක් කර ඇත. එහි විශේෂත්වය නම් ඒ සියල්ලටම උපමා රූපක ලබා දී තිබේ. ඒ සියල්ල පාරිසරික ස්ථාන වෘක්ෂලතා ආදිය පදනම් කරගෙන දක්වා තිබීමය.

**යතුරු පද :** අස්ථි, කර්මස්ථාන, කාය, ධාතු

**පර්යේෂණයෙහි වැදගත්කම**

මෙමගින් බෞද්ධ වර්ගීකරණ න්‍යායයට අයත් ක්‍රමවේදයේ විවිධත්වය අධ්‍යයනය කළ හැකිය. එසේම බෞද්ධ කායවිච්ඡේද විද්‍යාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ද ලබාගත හැකිය. තවද වෙනත් අට්ඨකථා තොරතුරු ආයුර්වේදය නවීන වෛද්‍ය විද්‍යාව වැනි තොරතුරු විමර්ශනය කිරීම තුළින් විෂය ඥාණය වර්ධනය කර ගත හැකිය. පොදුවේ ආයුර්වේද මතය අනුව මිනිස් ශරීරයෙහි ඇට සංඛ්‍යාව 360ක් වශයෙන් පිළිගත්තත් ශල්‍ය තන්ත්‍රයෙහි 300ක් වන බව දක්වා ඇත. ස්ථාන තුදුසක් හෙවත් ස්ථාන 14ක් ඇසුරු කරගෙන මේ ඇට එකකින් එකක් සම්බන්ධ වී ඇති බව සුශ්‍රුතය කියයි. ඒ සඳහා යෙදී ඇති පදය අස්ථි සංඝාත යන්නයි. දෙපා හි ස්ථානගත විළුඹ, දණහිස්, ඉකිළි ඇසුරු කරගෙන අස්ථි සංඝාත හයක් වෙයි. එක අතක මැණික් කටුව, වැලමිට, කිහිල්ල යන මේවායේ එක බැගින් අත් දෙකේ අස්ථිසංඝාත හයක් වෙයි. බාහු දෙක හා ග්‍රීවය ඇසුරු කරගෙන එක බැගින් ද වේ. එවිට එකතුව දාහතරකි. බෞද්ධ සාහිත්‍යයේ ද මිනිස් ශරීරයේ අස්ථි කොටස් වශයෙන් ගතහොත් 300ක් වන බව මෙවැනි මූලාශ්‍රයන් හි තහවුරු කර ඇත. ඒවා එසේම එම අස්ථි කොටස් විශේෂ ක්‍රමයකට විස්තර කර ඇත. මේ නිසා මෙවැනි විෂය ක්ෂේත්‍ර ස්වස්ථතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම හඳුනා ගැනීමට අදාළ දැනුම අවබෝධය කුසලතා වර්ධනය කර ගැනීමට මෙය සහය කරගැනීමේ අවකාශය ද ලබා දෙයි.

**පර්යේෂණ ගැටලුව**

මිනිස් ශරීරය ශරීර අංග, අස්ථි පද්ධතිය හැඳින්වීම විස්තර කිරීම වැනි විෂය මාතෘකා වෛද්‍යවිද්‍යාව විශේෂයෙන් කායවිච්ඡේද විද්‍යාවට අයිති විෂයයකි. එහෙත් වෛද්‍ය විද්‍යාවට නොදෙවෙනි ලෙස මිනිස් ශරීරය හා ශරීර කොටස් පිළිබඳ වර්ගීකරණයක් කිරීමට අට්ඨකථාකරු සමත් වී ඇති බැවින් අට්ඨකථාකරු එසේ කිරීමේ අරමුණු හඳුනා ගැනීම මෙහි පර්යේෂණ ගැටලුව වශයෙන් තබාගෙන ඇත.

**පර්යේෂණයෙහි අරමුණු**

- මිනිස් ශරීරය ගැන බෞද්ධ වර්ගීකරණයට අයත් විශේෂතාහඳුනාගැනීම්
- බෞද්ධ කායවිච්ඡේද විද්‍යාවේ විශේෂතා හඳුනාගැනීම්
- බෞද්ධ කායවිච්ඡේද විද්‍යාව විස්තර කෙරෙන තොරතුරුආයුර්වේද නවීන විද්‍යාව වැනි විෂය තොරතුරු සමග සසඳා බලා ඒවායේ සමවිෂමතා හඳුනාගැනීම්
- මෙවැනි විෂය කරුණු ඉදිරිපත් කිරීමේ අරමුණු හා ඉලක්ක කුමක්දැයි හඳුනා ගැනීම්

**සාකච්ඡාව**

මිනිස් ශරීරය හැඳින්වීම සඳහා බෞද්ධ සාහිත්‍යයේ සරීර, දේහ, කාය කලේබර ආදි පර්යාය පද භාවිතයට ගෙන ඇත. එයට අමතරව නාමරූප පංචස්කන්ධ වැනි සමාස පද භාවිතයට ගෙන ඇත. බෞද්ධ සාහිත්‍යයේ සේම මිනිස් ශරීරය වර්ගීකරණය කර ඇති ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ පොදු වේ ''කාය'' යන වචනය වැඩි වශයෙන් භාවිතයට ගෙන ඇති බව නිරීක්ෂණය විය. ''කාය'' චී චයේ ධාතුවෙන් එක්රැස්වීම යන අරුත ගෙන දෙයි. පාලි සාහිත්‍යය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව යන විෂයන් දෙකම එකම අරුතකින්, එමගින් මිනිස් ශරීරය ගැන විස්තර කර ඇත. නාමරූපයන්ගේ එකතුවකි. පංචස්කන්ධයන්ගේ එකතුවකි. චතුර්භූතයන්ගේ එකතුවය.

දෙතිස් මහා කුණපකොට්ඨාශයන්ගේ එකතුව ය. විශේෂයෙන් බෞද්ධ සාහිත්‍යයේ පංචස්කන්ධයන් ගේ හා නාමරූපයන්ගේ එකතුව යන තැන්හි කායික හා මානසික ක්‍රියාකාරකම් දෙකම අදහස් කර ඇත. තව ද බෞද්ධ සාහිත්‍යය සේම ආයුර්වේද වෛද්‍ය විද්‍යාවද ''කය'' මහා භූතයන්ගේ එකතුවේ ප්‍රතිඵලයක් බව කියයි. අටුවාචාරීහු ''පඨවි පඨවිපායන්ති අජ්ඣත්තික පඨවි ධාතු බාහිර පඨවි ධාතු'' යනුවෙන් කයත් බාහිර ලෝකයත් අතර එකම සබඳතාවක් ඇති බව කියයි. එනම් ලෝකයත් මිනිස් කයත් එකම මූලද්‍රව්‍යන්ගෙන් සැකසී ඇති බවට විස්තර කරයි. (සාරත්ථප්පකාසනී සංයුත්ත නිකායට්ඨකථාඃ 244)

1. පඨවි - තදබව, ඝනීභූතභාවය. (ථද්ධභාවො අයං පඨවි ධාතු)
2. ආපො - වැගිරෙන බව -ඇලෙනගතිය (ආබන්ධන භාවො අයං ආපො ධාතු)
3. තෙජො - උණුසුම් ගතිය නැතහොත් පැසෙන ගතිය (පරපාචන භාවෝ අයං තෙජො ධාතු)
4. වායො - ගතිකත්වයයි. සෙලවෙන ගතිය (විත්ථම්භන භාවො අයං වායො ධාතු)

මෙසේ නිකාය ග්‍රන්ථයන්හි චතුර්මහාභූතයන් සම්බන්ධ වූ මූලික අර්ථකථනය සිරුරේ නිර්මාණය සම්බන්ධව විස්තර කිරීම බව කරුණාදාස මහතා ගේ අදහසයි. (karunadasa: 17) එසේ වන්නේ අභිධර්ම පිටකය වැනි මනෝමය ධර්ම විස්තර කිරීමේ දී වඩ වඩාත් ගැඹුරු අරුතකින් මේවා සාකච්ඡාවට ගෙන ඇති බැවිනි. භෞතික මිනිස් ශරීරය හෙවත් ''කාය'' අරුතින් ගන්නා විට,

පඨවි ධාතු - කෙස්, නිය, දත්, සම්, මස් ආදිය

ආපෝ ධාතු - පිත, සෙම, සැරව, ලේ, දහඩිය, කඳුළු ආදිය

තේජෝ ධාතු - ආහාර දිරවන හා ශරීර උෂ්ණත්වය

වායෝ - ආශ්වාස ප්‍රශ්වාස මූලික කරගත් චලනත්වයයි.

ආයුර්වේද මූල ග්‍රන්ථයක් වූ චරක සංහිතාව ''කය'' යනු පංච මහා භූතයන්ගෙන් සැකසුණු චේතනාධිෂ්ඨානය බව තහවුරු කර ඇත. (චරක සංහිතාවඃ ස 344) එහි දී මහා භූතයන් යනු ආකාශ, වායු, ආප් පෘථිවි යනුවෙන් දක්වයි. (චරක සංහිතාවඃ 310) මෙහි ආකාශ භූතය ගැන ද සඳහන් වෙයි. එහි දී චිකිත්සාවට භාජනය වන පුද්ගලයා පුරුෂ නමින් හැඳින්වෙයි. ඔහු පංචමහාභූතයන් හා චේතනා ධාතුවෙන් සමන්විත වන බව විස්තර කර ඇත. සුශ්‍රැත සංහිතාව ද පංච මහා භූත ශරීර සමවායඃ (සුශ්‍රැත සංහිතාව 5 අධ්‍යාය) මේ අදහස් ම අනුමත කරමින් මෙසේ ඉදිරිපත් කර ඇත.

අස්ථි සංස්කෘත ආමන්ත්‍රණයයි. අස්ථි (ක) බ ඇට - බිජුවට, අස්ථි ච - ඇටමිදුලු අස්ථිපඤ්ජර ච ඇටසැකිල්ල, අස්ථිභංග, ඇටබිඳුම, ආදී ව්‍යවහාරයෙන් එයට ඇතුළත් ය. (වැලිවිටියේ සෝරත, 5330) අස්ථි, න, ගෙඩියක මදය හෝ ඇටය, (පුවසති අලගියවන්න 204) පාලි භාෂාවේ අට්ඨි, න, ඇටයඃ ඇටකටු (පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිර) අට්ඨි - ඇට, එලාදීන්ගේ බීජ (මඩිතියවෙල සුමංගල හිමි 21) සිංහල යෙදුම ඇට 1 ශරීරයෙහි මසින් වැසී තිබෙන දැඩි කොටස, ඇටමැදිරි සිරුරෙහි ඇට කූඩුව (වැලිවිටියේ සොරත,143) ඇටසැකිල්ල /ඇටසැකිලිය/ඇට හැකිල්ල නා. ශරීරය දරා සිටි ඇටවරාමුව, ඇට කූඩුව, අස්ථි පංජරය, (හරිශ්චන්ද්‍ර විජයතුංග 251) අස්ථි - ඇට - (අමර ශබ්දාවලීඃ 22)

**අස්ථි පිළිබඳ විද්‍යාත්මක මතය**

ශරීරය දරා සිටීමට බොහෝ සතුන්ට යම් විදියක සැකිල්ලක් තිබේ. සැකිල්ලේ ස්වභාවය සත්ත්ව වර්ගය අනුව වෙනස් විය හැකිය. මිනිසා ඇතුළු ප්‍රමාණයෙන් විශාල සත්ත්ව ප්‍රභේදයන්ගේ ඇට ආධාරක පටක ලෙස විකාශනය වී ඇත.

නො වියළි අලුත් ඇට කැබැල්ලක් සියුම්ව පරීක්ෂා කර බලන විට ඇට සැදී ඇත්තේ කිසියම් ද්‍රව්‍යයක් ස්තරය පිට ස්තරය වශයෙන් තැන්පත් වීමෙන් ය. එම ස්තර අතර සියුම් හිඩැස් ද වන බව නිරීක්ෂණය වෙයි. කැල්සියම් ලවණ අඩංගු ඔසෙයින් නැමැති ප්‍රෝටීන වර්ගයකින් ඉහත සඳහන් ස්තර (ශරාවක) (lamellae) සැදී ඇත. මෙහි වැඩිකොටස පොස්පේට් ලවණ මූලද්‍රව්‍ය ද මැග්නීසියම්,

යකඩ හා මැංගනීස් වැනි වෙනත් ලෝහ මූලද්‍රව්‍ය ද වන බව නවීන විද්‍යාත්මක මතයයි.

නූතන මතය අනුව අස්ථි නිර්මාණය වී ඇත්තේ කාබනික හා අකාබනික මූල පදාර්ථයන්ගෙනි. අස්ථි වර්ග කිරීමේ දී හැඩය අනුව දිග ඇට, කෙටි ඇට, පෙතලි ඇට, අක්‍රමවත් හැඩති ඇට, වායු අවකාශ ඇති ඇට ආදී වශයෙන් විවිධ වේ. (Poul R. Wheate:1444)

**අස්ථි නාම හා ස්ථාන පිළිබඳ ආයුර්වේද මතය**

අස්ථි කොටස් පිළිබඳ පැහැදිලි විග්‍රහයක් ආයුර්වේද මූලග්‍රන්ථයක් සේ සැලකෙන සුශ්‍රැත සංහිතාවේ ශරීරස්ථානය 5 අධ්‍යායයෙහි දැක්වේ.

''ඇට තුන්සිය සැටෙකයි ආයුර්වේදවාදියෝ කියති. නමුත් ශල්‍ය තන්ත්‍රයෙහි ඇට තුන්සියයක් වශයෙන් ගණන් ගැනේ. ඒ තුන්සිය අතුරින් එකසිය විස්සක් ශාඛාවන් හි (දෑත හා දෙපයේ) ද ශ්‍රෝණිය දෑලවර - පිට- උදරය - පපුව යන තැන්වල එකසිය සතළොසක් ද දසරුවෙන් උඩ තෙතිසක් දැයි යනුවෙනි'' (සුශ්‍රැත සංහිතාවඃ 355)

පොදුවේ ආයුර්වේද මතය අනුව මිනිස් ශරීරයෙහි ඇට සංඛ්‍යාව 360ක් වශයෙන් පිළිගත්තත් ශල්‍ය තන්ත්‍රයෙහි 300ක් වන බව දක්වා ඇත. ස්ථාන තුදුසක් හෙවත් ස්ථාන 14ක් ඇසුරු කරගෙන මේ ඇට එකකින් එකක් සම්බන්ධ වී ඇති බව සුශ්‍රැතය කියයි. ඒ සඳහා යෙදී ඇති පදය අස්ථි සංඝාත යන්නයි. දෙපා හි ස්ථානගත විළුඹ, දණහිස්, ඉකිලි ඇසුරු කරගෙන අස්ථි සංඝාත හයක් වෙයි. එක අතක මැණික් කටුව වැලමිට කිහිල්ල යන මේවායේ එක බැගින් අත් දෙකේ අස්ථිසංඝාත හයක් වෙයි. බාහු දෙක හා ග්‍රීවය ඇසුරු කරගෙන එක බැගින් ද වේ. එවිට එකතුව දාහතරකි. සුශ්‍රැත සංහිතාවේ මිනිස් ශරීරයේ සියලු අස්ථි කොටස් කුලක පහකට ගොණු කොට දක්වා ඇත. එනම්, පස් වැදෑරුම් වන බව දැක්වෙයි.

01. කපාලාස්ථි

02. රුචකාස්ථි

03. තරුණාස්ථි

04. වලයාස්ති

05. නලකාස්ථි

දනහිස්, තට්ටම්, උරහිස්, කම්මුල්, නළල, හිස යන ස්ථාන වල ඇති ඇට සියල්ල කපාලාස්ථි කුලකයට අයත් බව කියයි. දත් සියල්ල රුචකාස්ථි ලෙස නම් කර ඇත. නාසය, කන්, ගෙල, අක්ෂිකෝෂය යන ස්ථාන වල පිහිටි අස්ථි සඳහා දී ඇති නාමය තරුණාස්ථි නම් වෙයි. අත්, පා, දෑල, පිට උදරය, පපුව යන තැන්වල ඇති ඇට නලකාස්ථි නම් වේ. මෙසේ පාදයක එක් ඇඟිල්ලක අස්ථි පුරුක් තුන බැගින් එකතුව 15කි. යටිපතුල (පාදතල) කූර්ච, විලුඹ යන ස්ථානවල අස්ථි 10කි. පතුල් ඇට ශලකාස්ථි නමින් හැඳින්වේ. ශලකාස්ථි පහකි. මේ සියල්ල එකට බැඳී ඇති අස්ථියක් ද වෙයි. ඒ අනුව ශලකාස්ථි පහයි. බැඳි ඇටය කූර්චයෙහි දෙකක්ද, විළුඹේ දෙකක් ද එකතු වී දහයේ වර්ගය සෑදී ඇත. විළුඹේ පසුපස එක් අස්ථියක් ද, කෙණ්ඩ කොටසේ දෙකක්ද, දණහිස් ඇටය ද, කලවයේ එකක් ද එකතු වී එක් පාදයක අස්ථි 30ක් වන බව දැක්වේ. එවිට පාද දෙකේ ම අස්ථි 60 වන අතර අත් දෙකේ ද මෙසේ ම 30 බැගින් එකතු වී අත් පා (ශාඛා) වල අස්ථි 120 වන බව දක්වයි. මෙසේම සුශ්‍රැත සංහිතාවේ ශ්‍රෝණිපාදිගත අස්ථි විවරණයක් දී ශරීරයේ කඳ කොටසේ ස්ථානගත අස්ථි ගැන ද විස්තර කර ඇත. ගුද ප්‍රදේශයේ එකක්ද භගස්ථානයෙහි එකක් ද තට්ටම් දෙකේ දෙකක් ද, තුනටියේ එකක් ද, එකතුවී ශ්‍රෝණි කොටසේ ඇති සංඛ්‍යාව 05කි. ශරීරයේ ඉහළ කොටසේ අස්ථි විස්තර කිරීමේදී ''ඇළයෙක'' යන පදය භාවිත කර ඇත. එවිට වම්පස ඇළය පෙදෙසේ අස්ථි 36කි. දකුණු පස ඇළය පෙදෙසේ අස්ථි 36කි. එකතුව අස්ථි 72කි. ශරීරයේ මැද කොටස එනම්, පපු ප්‍රදේශය වෙනම දක්වා ඇත. පපු ප්‍රදේශයේ ඇට අටක් හා ''අක්ෂක'' නමින් හඳුන්වන විශේෂ අස්ථි 02ක් ද, දක්වයි. එවිට එකතුව 10කි. මෙසේ ශ්‍රෝණි නම් කඳ කොටසේ අස්ථි කොටස් වල එකතුව 117කි. ඉන් අනතුරුව ශරීරයේ ඉහළම කොටසේ අස්ථි දැක්වීමේ දී ග්‍රීව කොටසේ අස්ථි 09ක් ද උගුරු දණ්ඩ ආශ්‍රිතව 04ක් ද, හකුවල 02ක් ද, නාසයේ අස්ථි 03ක්ද, තල්ලේ 01ක් ද, කන ආශ්‍රිතව 02ක් ද, වන බව දක්වා තිබේ.

මුඛයේ ස්ථානගත දත් වෙනම ම අස්ථි 32ක් ලෙස ගණනය කර ඇත. එයට අමතරව මස්තකය හෙවත් හිස කොටසේ අස්ථි 06ක් වන බව කියයි. මෙවිට දසරුවෙන් උඩ කොටසේ පිහිටි අස්ථි සංඛ්‍යාව 63කි. ''ඇතුළත සිටුනා සාර පදාර්ථයෙන් ගස් වර්ග දරා සිටින්නාක් මෙන් අස්ථි සාරයෙන් මිනිස් සිරුද ඒකාන්තයෙන්ම දරා සිටී. ඇට සාර පදාර්ථය හෙවත් සිරුරේ සිවි- මස් දෙක විනාශ වැ බොහෝ කල් ගත වූවත් අස්ථි සාරය නැසී නො යෙයි. මස්, සිරා, ස්නායු, යන මේවා ඇටවල බැඳ පවත්නා හෙයින් ඇට ක්ෂය නොවේ. වැටී නො යෙයි'' (සුශ්‍රැත සංහිතාවඃ 366).

සුශ්‍රැත ආචාර්යවරයා මෙතනදී මිනිස් ශරීරය ගසකට උපමා කර තොරතුරු විස්තර කර ඇති බව නිරීක්ෂණය කර ගත හැකිය.

**බෞද්ධ සාහිත්‍යාගත අස්ථි කොටස් වර්ගීකරණය**

බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන තොරතුරුවලට අනුව මිනිස් ශරීරයේ අස්ථි කොටස්වල එකතුව 300කි. ශාඛා අස්ථි 150කි. කඳ කොටසේ 61ක් ද දසරුවින් උඩ කොටසේ අස්ථි 64ක්ද ඇති බව දක්වා තිබේ. බෞද්ධ සාහිත්‍යයට සමකාලීන ආයුර්වේද සාහිත්‍ය මූලාශ්‍රයන් වන චරක හා සුශ්‍රැත මූලාශ්‍රයෙහි දැක්වෙන තොරතුරු බොහොමයක බෞද්ධ මූලාශ්‍රය තොරතුරු හා බැඳේ. එහෙත් ආයුර්වේද මූලාශ්‍රය දත් හා නිය ආදිය ද අස්ථි කොටස් වල ම ප්‍රභේද වශයෙන් වෛද්‍ය විද්‍යාත්මක පදනම ඔස්සේ දක්වා ඇති බව නිරීක්ෂණය වෙයි. බෞද්ධ සාහිත්‍යය දත් අස්ථි ගණයේ නො තබා වෙනම විස්තර කර ඇත.

| අ.අ | ශරීර ස්ථානය | අස්ථි සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අත් | 64 |
| 2 | පා | 64 |
| 3 | මස් ආශ්‍රිත | 64 |
| 4 | විළුඹ | 04 |
| 5 | ගොප් | 04 |
| 6 | කෙණ්ඩා | 04 |
| 7 | දණ | 02 |
| 8 | කලව | 02 |

| | | |
|---|---|---|
| 9 | කටී | 02 |
| 10 | පිටකටු | 18 |
| 11 | ඉල ඇට | 24 |
| 12 | ලය ඇට | 14 |
| 13 | හෘදය ඇසුරු කරගත් | 01 |
| 14 | අකු ඇට | 02 |
| 15 | පතුල | 02 |
| 16 | බාහු | 02 |
| 17 | අත් බාහු | 02 |
| 18 | ගෙල | 07 |
| 19 | හණු | 02 |
| 20 | නාසා ඇට | 01 |
| 21 | ඇස් ඇට | 02 |
| 22 | කන් ඇට | 02 |
| 23 | නළල් ඇට | 01 |
| 24 | මූර්ධා ඇට (මුදුනෙ) | 01 |
| 25 | හිස් කබල් | 09 |
| **එකතුව** | | **300** |

විභංගඅට්ඨකථාවේ සතිපට්ඨාන විභංගයෙහි කේසා ලෝමා ආදී වශයෙන් විස්තර කර ඇති ශරීර අංග අතර 8 වැනි අංගය වන්නේ අස්ථි හෙවත් ඇටයි. ''අට්ඨි යනු දත් තිස් දෙක හැර ගණනින් තුන්සියයක් පමණ යයි කියයි. දත් තිස් දෙක හැර අත් ඇට හැට හතර අල්ලේ ඇට දෙක එක් එක් පාදයෙහි ගොප් ඇට දෙක, ජංගා ඇට දෙක ද දණ ඇට දෙක, කලවා ඇට දෙක, කටී ඇට දෙක, පිටකටු ඇට දහඅට බෙල්ලේ ඇට හත,ඉල ඇට විසි හතර, උර ඇට දාහතර, හෘදය ඇට එක, අකු ඇට දෙක, කොට්ඨ ඇට දෙක, බාහු ඇට දෙක, අග්‍ර බාහු ඇට දෙක, හකු ඇට දෙක, නාස්ඇට එක, ඇස් ඇට දෙක, කන් ඇට දෙක, නලල් ඇට එක, මුදුන් ඇට එක, හිස් කපාල ඇට නවය, මෙසේ ඇට තුන් සියයක් පමණ ඒ සියල්ල වර්ණය සුදුවිය. සටහන් වශයෙන් විවිධය'' (විභංගඅට්ඨකථාවේ සතිපට්ඨාන විභංගයඃ 197) යයි විස්තර කර ඇත. ඇට වල ස්වභාවය දැක්වීමේ දී පාරිසරික උපමා යොදාගෙන විස්තර කර ඇත.

| අ.අ. | අස්ථි කොටස (වර්ගය) | පාරිසරික ද්‍රව්‍ය උපමාව |
|---|---|---|
| 1 | පා ඇඟිලි ඇට | ඉගිනි ඇට සමානය |
| 2 | එම මැද ඇට | කොස් ඇට සමානය |
| 3 | මූල පර්ව ඇට | පණා බෙර සමානය |
| 4 | පිටි පාද ඇට | කීඩාරම් අල සමූහය මෙනි |
| 5 | අල්ලේ ඇට | තල් ඇටය මෙනි |
| 6 | ගොප් ඇට | පන්දු ගුලියක් මෙනි. |
| 7 | දඟ ඇට | පාසි බැඳුනක ගොබය වැනි |
| 8 | කුඩා දඟ ඇට | දුණු දණ්ඩක් මෙනි |
| 9 | දණිස් ඇට | නයි පෙණයක් මෙනි |
| 10 | දඟ ඇටය පිහිටි තැන | තුඩ සහිත ගව අඟක් මෙනි |
| 11 | කලවා ඇට | වෑයක මිටක් මෙනි |
| 12 | කටිය | රවුම් කුඤ්ඤයක් මෙනි |
| 13 | කටිය අග කොටස | දොඹ ඇට මෙනි. |
| 14 | කටී ඇට එකතුව | කුඹල් උඳුන මෙනි |
| 15 | තට්ටම් ඇට | යටිකුරු කළ නා පෙනය මෙනි |
| 16 | ජිද්දාවජිද්දය | පිට ඇට එකපිට තබා වෙළුමක් කලා මෙනි |
| 17 | ඉල ඇට | කඩු පත මෙනි |
| 18 | ඉල ඇට එකතුව | සුදු කුකුලෙකු පියාපත් දිග හැරියා මෙනි |
| 19 | උර ඇට එකතුව | රිය මැදිරියක් මෙනි |
| 20 | හෘද ඇටය | හැඳි පෙණයක් මෙනි |
| 21 | අකු ඇට | කුඩා වෑයක් මෙනි |
| 22 | යටිබඩ ඇටය | එක් අංශයක් ගෙවුණු සිංහල උදැල්ලක් මෙනි |
| 23 | බාහු ඇට | උදැල්ලක් මෙනි |
| 24 | අග්‍රබාහු ඇට | තල් කඳක් මෙනි |
| 25 | මණික් කටුව | එක් අංශයක් ඇලවූ හිස් වෙළුම් පටියක් මෙනි |
| 26 | පිටි අතේ ඇට | තලන ලද කීඩාරම් අලයක් වැනි |
| 27 | අත් ඇඟිලි පුරුක් | පණාබෙර මෙනි |
| 28 | ඇඟිලි මැද පුරුක් | අසම්පූර්ණ කොස් ඇට මෙනි |
| 29 | ඇඟිලි අග පුරුක් | ඉගිනි ඇට මෙනි |

| | | |
|---|---|---|
| 30 | බෙල්ලේ ඇට | දැව දණ්ඩ විද උණ ගොබ වැහැරිය සවිකළා මෙනි |
| 31 | යටි හනු | කුලුගෙඩි යොතක් මෙනි |
| 32 | උඩ හනු | සුරා දැමූ ආයුධයක් මෙනි |
| 33 | ඇස් කුප හා නාස් කුප ඇට | ලොඳ රහිත තල් එලයක් මෙනි |
| 34 | නළල් ඇටය | යටිකුරු කර තැබූ හක්ගෙඩි පළුවක් මෙනි |
| 35 | කන්සිළු ඇට | කරණවෑමියන් ගේ දැලිපිහි කොපුවක් මෙනි |
| 36 | නළල | ගිතෙල් තැවරූ රෙදි කඩක් මෙනි |
| 37 | මුදුන් ඇට | මුව සිඳින ලද පොල් ගෙඩිය මෙනි |
| 38 | හිසේ ඇට | ලබු කබලක් මෙනි |

(විභංග අට්ඨකථාවේ සතිපට්ඨාන විභංගඃ 197)

මෙහි දැක්වෙන ආකාරයට අස්ථි සියල්ල වර්ගකර ඇත්තේ ජන සමාජය පොදුවේ භාවිතයට ගන්නා ව්‍යවහාර ක්‍රමයටය. අල්ල, පිටි අත, දණහිස්, ඇඟිලි ආදිය එයට නිදසුන් ය. එහි හැඩය බාහිර පෙනුම සැලකිල්ලට ගෙන එය ජන සමාජයේ නිතර භාවිතයට ගැණෙන ඇස ගැටෙන භෞතික ද්‍රව්‍යයකට උපමා කර ඇත. ආහාරයට ගන්නා ද්‍රව්‍ය ද්‍රව්‍යය, ඇට වර්ග, ශාක වර්ග උපමා සඳහා යොදා ගැනීමට අට්ඨකථාකරු උපක්‍රමශීලී වී ඇත. කිඩාරම් අල, කොස් ඇට, මී ඇට, තල්, පොල්, උණ දඬු ඒ සඳහා නිදසුන් වශයෙන් උපුටා දැක්විය හැකිය. තව ද නිතර ඇස ගැටෙන ජන සමාජයට හුරු සත්ත්වයින් ගේ ශාරීරික අංගද කලාතුරකින් භාවිතයට ගෙන ඇත. හරක් අඟ, නයිපෙනය, හක්බෙල්ලා. සුදුකුකුළු පියාපත් වැනි යෙදුම් එයට නිදසුන් වශයෙන් උපුටා දැක්විය හැකිය. කෘෂි ආර්ථික ශිෂ්ටාචාරයක භාවිතයට ගන්නා උපකරණ බොහොමයක් ද උපමා වශයෙන් යොදාගෙන ඇත. වැය, පොරව, කියත, කුලුගෙඩිය, දුනු දණ්ඩ, දැලි පිහිය ආදිය එයට සාධක වශයෙන් උපුටා දැක්විය හැකිය. විශේෂයෙන් අට්ඨකථාකරු යටිබඩ ඇටය විස්තර කිරීමේදී උපමාවට ගෙන ඇත්තේ අඩක් ගෙවුණු සිංහල උදැල්ල ය. පැරණි ආර්ථික

කටයුතු වල ද ජාතික හා ප්‍රාදේශීය අනන්‍යතාව පරිදි නිෂ්පාදනය කරගත් විශේෂ උපකරණ වෙයි. මේ එවන් අවස්ථාවකි. මෙහි එවකට පැවති විවිධ කර්මාන්ත පිළිබඳවද තොරතුරු නියෝජනයක් වෙයි. ගොවිතැන්, කුඹල් කර්මාන්තය, ලෝහ කර්මාන්තය, වඩු කර්මාන්තය, වෛද්‍ය කර්මය එයට නිදසුන් ය. ඇතැම් අස්ථි කොටස් පිළිබඳ විස්තර කිරීමේදී අස්ථි කිහිපයක් එකතු වී නිර්මාණය වන බාහිර ව්‍යුහය ඒ හා සමාන සම්පූර්ණ ද්‍රව්‍යයක් හෝ පාරිසරික ස්ථානයක් ශ්‍රාවකයාට කාල්පනික ව සිහිපත් කරදීමට උපක්‍රමශීලී වී ඇත.

''උර ඇට දාහතර සිදින ලද රිය මැදිරියක් මෙනි''

''කටී ඇට දෙකේ එකතුව කුඹල් කරුවෙකුගේ උදුන මෙනි''

''ඇස් කූප නාස් කූප ඇට මද අරන් දැමූ තල් කුරුම්බැට්ටි මෙනි''

(විභංග අට්ඨකථාවේ සතිපට්ඨාන විභංගඃ 197)

මෙවැනි තොරතුරු වල කලාපීය අනන්‍යතාවක් ද වෙයි. විශේෂයෙන් තල් ශාකය ප්‍රචලිත වියළි කලාපයේ ය. පොල් තැඹිලි මෙන් නොව තල් ගෙඩි වල සාරය ගබඩා වී ඇත්තේ කුහර තුනක ය. තරුණ තල් ගෙඩිය මුවාහත් පිහියකින් උඩ පැත්ත කපා ඇඟිල්ලෙ ආධාරයෙන් මුවට ළං කර එහි සාරය උරා බොයි. ඉවත දමන තල් ගෙඩිය මුව පැත්ත නෙත ගැටෙන අපට මිනිස් මුහුණක් පිහිසිහිපත් වේ. එය අට්ඨකථාකරු කදිමට අදාළ චිත්‍රය මනසේ මවා ගැනීමට මෙතැනදී උපයෝගී කරගෙන ඇති බව නිරීක්ෂණයය වෙයි. බුද්ධඝෝෂ හිමියන් ශරීර අස්ථි වල පිහිටීම අවරෝහණ පිළිවෙළට මෙන්ම ආරෝහණ පිළිවෙලට යන දෙ විදියටම විස්තර කර තැබීමට ක්‍රියා කර ඇත.

විභංග අට්ඨකථාවේ දෙපතුලේ සිට ඉහළට අස්ථි වල ස්ථානගත වීම හා පිහිටීම ''ඇට වල පතුලේ ඇට ගොප් ඇට ඔසවා සිටී. ගොප්ඇට කෙණ්ඩා ඇට ඔසවා සිටී. කෙණ්ඩා ඇට කලවා ඇට ද කලවා ඇට තුනටිය ඇට ද තුනටිය ඇට කොඳු ඇට ද කොඳු ඇට බෙල්ලේ ඇට ද බෙල්ලේ ඇට හිසේ ඇට ද ඔසවා සිටී. හිසේ

ඇට බෙල්ලේ ඇට මත පිහිටියේ ය. බෙල්ලේ ඇට කොඳු ඇට මත ද කොඳු ඇට තුනටියේ ඇට මත ද තුනටියේ ඇට කලවා ඇට මත ද කලවා ඇට කෙණ්ඩා ඇට මත ද කෙණ්ඩා ඇට ගොප් ඇට මත ද ගොප් ඇට පතුලේ ඇට මත ද පිහිටියේ''. (විභංගට්ඨකථා: 48) යනුවෙන් විස්තර කර ඇත.

විසුද්ධිමග්ගයේ දී ද පඨවි ධාතුව නියෝජනය කරන ශරීර අංග විස්සක් යැයි දක්වන තැන අටවෙනි අංගය ලෙස ''අස්ථි'' ගැන දක්වා ඇත. ''ඇට අතුරින් විලුම් ඇටය, ගොප් ඇටය, ඔසවා සිටී ගොප් ඇටය, කෙණ්ඩා ඇටය ද එය දණ ඇටයද, එය කලවා ඇටයද, එය උකුළු ඇටය ද, එය පිට කටුව ද, එය ගෙල ඇටය ද, එය හිස් කබල ද ඔසවා සිටී. එසේ මැ හිස් කබල ගෙල ඇටයෙ හි පිහිටියේ ය. ගොප් ඇටය විළුම් ඇටයෙහි පිහිටියේ ය''(විසුද්ධිමාර්ගය: 525)

මෙහි දී ද ආරෝහණ පිළිවෙලකට දෙපතුල සිට ශරීරය ඔසවා සිටින අස්ථි පංජරය පැරණි වාස්තු ගෘහයක් උපමාවට ගෙන විස්තර කර ඇති බවද නිරීක්ෂණය වෙයි.

විභංග අට්ඨකථාවේ ධාතු විභංගයේ ''මාංස ඇට කූඩුව ආලේප කොට සිටි මැටි වලින් ආලේප කළ බිත්තියක් වේ මැටි වලින් ආලේප කරනු ලදිමි බිත්තිය නොදනි. මවිසින් බිත්තිය ආලේප කරන ලදැයි මැටි නොදනි. එසේම මංසයෙන් ආලේප කරන ලදිමි යි අස්ථි පංජරය නොදනි. මවිසින් අස්ථි පඤ්ජරය ආලේප කරන ලදැයි මාංස නොදනී'' (විභංගට්ඨකථා: 47)

මෙහි දී සම්පූර්ණ අස්ථි එකතුව සඳහා එනම් ශරීර කූඩුවට අස්ථි පංජරය යන ඇමැතීම ලබාදී ඇති බවද නිරීක්ෂණය වෙයි. මේ අනුව මිනිස් ශරීරයේ ව්‍යුහය පැරණි වාස්තු ඉදිකිරීම් වල ප්‍රාථමික ඉදිකිරීම් විශේෂයක් කටු මැටි වරිච්චි බිත්ති ක්‍රමය ආදර්ශයට ගෙන විස්තර කිරීමට අට්ඨකථාකරු මහත් අභිරුචියක් දක්වා ඇති බව ද තහවුරු කරගත හැකිය.

අට්ඨකථාකරුවන් සෘජුවම වෛද්‍ය වෘත්තියට සම්බන්ධ එකී වෘත්තීය ඥානයෙන් පරතෙරට ගිය පුද්ගල චරිත ලෙස ක්‍රියා කර ඇති බවක් වාර්තා නොවේ. එනමුදු වෛද්‍ය විද්‍යාවට සමගාමී තොරතුරු

රාශියක් භාවිතයට ගෙන ඇති බව මෙමගින් නිරීක්ෂණය වේ. මූලික අරමුණු තුනක් ඇසුරු කරගෙන මෙසේ ඒ වන විට භාවිත, පිළිගත් වෛද්‍ය ක්‍රමයකට සම්බන්ධ කරුණු අට්ඨකථාකරණයේ දී භාවිතයට ගෙන ඇති බව නිරීක්ෂණය වෙයි.

1. ධර්ම කරුණු විස්තර කිරීමට මෙන්ම වඩාත් විස්තරාත්මකව විස්තර කිරීමේ දී
2. උපමා හා නිදසුන් භාවිතයට ගැනීමේ දී
3. ශ්‍රාවකයා උපරිමයෙන් අරමුණු හා ඉලක්කය වෙත යොමු කිරීමේ උපක්‍රම වශයෙන්

බුදු දහමේ මූලික සිද්ධාන්තයක් වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය පැහැදිලි කිරීමේ දී ආරම්භයේ සිටම සූත්‍ර සාහිත්‍යයේ බොහෝ තැනක විද්‍යාත්මක සිද්ධාන්ත සාකච්ඡාවට ගෙන ඇත. විශේෂයෙන් මිනිස් සිරුරේ පිළිකුල් සහගත ස්වභාවය දැක්වීම සඳහා ශරීර ව්‍යූහය පිළිබඳ විශ්ලේෂණය කර ඇත. අටුවාචාර්යයෝ කර ඇත්තේ තවදුරටත් එම තොරතුරු සවිස්තරව පැහැදිලි කර ගැනීමට විවිධ විෂය තොරතුරු සහය කර ගැනීමකි. මෙම පැහැදිලි කිරීම් වලට භාරතීය සංකල්ප තොරතුරු සේම සමකාලීන යුගය එනම් අනුරාධපුර මුල් යුගයට අයත් තොරතුරු ද සහාය කර ගැනීම ද සිදු කර ඇති බව තහවුරු විය.

අට්ඨකථාකරුගේ මුඛ්‍ය අරමුණ වී ඇත්තේ මෙමගින් ශරීරයේ ඇති අස්ථිරතාව පිළිකුල්බව ශ්‍රාවකයාට අනාවරණය කිරීම බව නිරීක්ෂණය වෙයි. එමගින් අධ්‍යාත්මික ඥානයන් ගොඩනගා ගැනීමට මෙම අස්ථි පදාර්ථ පඨවි ධාතුව යටතේ විස්තර කර ඇත. එහි ක්‍රම විද්‍යාව වී ඇත්තේ කාලීන සමාජයේ පැවති වෛද්‍ය විද්‍යාත්මක ඥාණය මගින් අන්තරාව ලෝකනයයි. වෛද්‍ය විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් බැලීම වෛද්‍ය කර්මයට විෂය ගෝචර වූවකි. එයින් සෑහීමකට පත් නොවී අරමුණ ඉටුකර ගැනීමට පාරිසරික සිද්ධි අධ්‍යයනය බෞද්ධ ක්‍රමය අගය කර ඇති බව තහවුරු වෙයි. ඒ බව විසුද්ධිමාර්ගය මෙන්ම විභංග අට්ඨකථාව වැනි මූලාශ්‍රය තොරතුරුවලින් තහවුරු වෙයි.

''මහණෙනි, දක්ෂ වූ ගෝඝාතකයෙක් ගව දෙනක මරා සතර මං සන්ධියක (විකිණීම පිණිස) කොටස් වශයෙන් බෙදා හුන්නාක් මෙන් යම්කිසි යෝගාවචර භික්ෂුවක් සිටි වතම සිටී. පිහිටි සේ පිහිටි මේ ශරීරය මෙහි පෘථිවි ධාතු ඇත. ආපෝධාතු ඇත........'' (විසුද්ධිමාර්ගයඃ452)

විශුද්ධිමාර්ගයේ චතුර්ධාතු ව්‍යවස්ථාන එන උක්ත විස්තර කිරීමෙන් අරමුණ කුමක්දැයි තහවුරු කර ගත හැකිය. ජරා මරණයෙන් මිදෙනු කැමති ආදිකම්මික භික්ෂුව එක් ආකාරයකින් ඉගෙනීමේ දක්ෂතා කැමති විය යුතුය. එහි වචනයෙන්, මනසින්, වර්ණයෙන්, සටහනින්, දිසාවෙන්, අවකාශයෙන්, වෙන් කිරීම යන මේ සත් ආකාරයෙන් මෙම ධාතු මනසිකාරයෙහි කුසලතා ඇති කර ගත යුතුය. මෙමගින් තොරතුරු ඉදිරිපත් කිරීමේ අරමුණ කුමක්දැයි මේ අනුව පැහැදිලි ය. එනම්, අධ්‍යාත්මික ඥාණය වර්ධනය කිරීමයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

පුවසති, අලගියවන්න (2004). *සංස්කෘත සිංහල ශබ්ධකෝෂය*, කොළඹඃ සූරිය ප්‍රකාශකයෝ,

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (2020). *පාලි සිංහල අකාරාදිය* කොළඹඃ ඇම්.ඩී ගුණසේන සහ සමාගම (පුද්)

බුද්ධදාස ආර්. (2007). සංස් *සුශ්‍රැත සංහිතාව*, කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

බුද්ධදාස ආර්. (2007). සංස් *චරක සංහිතාව*, කොළඹඃ ආයුර්වේද දෙපාර්තමේන්තුව

*විභංගට්ඨකථා සිංහල පරිවර්තනය*, (2007). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

පියදස්සි හිමි, විදුරුපොල, (1994). *සාරත්ථප්පකාසිනී* (සංයුත්ත නිකායට්ටකථා) ත්‍රිපිටක මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ (1963). *ශ්‍රී සුමංගල ශබ්ධකෝෂය*, කොළඹඃ (ප්‍රථම භාගය) ද්විතීය මුද්‍රණය, ඇස්. ගොඩගේ පොත් සමාගම.

Karunadasa, Y. (1989). *Buddhist Analysis of Matter* 2nd Edition, Singpore:

Poul R. Wheater (1987). *Functional Histalogy* 2nd Edition, Honkong: